F - 05

# "ශ්‍රී ලංකාවේ අකුරු දත් නොදත් කම"

## LITERACY IN SRI LANKA

මොහොට්ටිගේ උපාලි සේදර
(ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලය)

මෙරට මුලු ජනගහනයේ 78.1% අකුරු දත් පිරිස බැව් 1971 සංගණන වාර්තාවෙන් හෙළිවේ. 1881 සිට 1971 දක්වා අකුරු දත් ජාතික ප්‍රතිශතය ක්‍රමයෙන් හා සංගතව ඉහළ ගොස් ඇත. මෙරට ස්ත්‍රී ජනකොටසට වඩා පිරිමි ජන කොටස තුල අකුරු දත් ප්‍රතිශතය වැඩිය. ග්‍රාම්‍ය ජන කොටසෙහි අකුරු දත් ප්‍රතිශතයට වඩා නාගරික ජන කොටසෙහි ප්‍රතිශතය ඉහළය.

එහෙත් මෙරට අකුරු නොදත්කම පිළිබඳ තත්වයේ අනපේක්ෂිත ලෙස වැඩිවෙමින් පවතී. සියවසක් තිස්සේ පහළ වැටෙමින් තිබූ අකුරු නොදත් ප්‍රතිශතය සීඝ්‍රයෙන් යළි වැඩිවීමක් මෙම විග්‍රහයෙන් අනාවරණය වේ. අකුරු නොදත්කම නාගරික පිරිමින් අතර සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. පොදුවේ සෑම ජනකොටසක් තුලම අකුරු නොදත් ප්‍රතිශතය වැඩෙමින් පවතී. වැඩිවීම් අවම වේගයකින් සිදුවී ඇත්තේ ග්‍රාම්‍ය කාන්තා ජනගහනය තුලය.

1881 සිට ක්‍රමයෙන් ඉහල ගිය අකුරු දත් ප්‍රතිශතය 1981 වන විට යලි පහත වැටීමට තරම් ප්‍රමණතාවක් දුන් ශ්‍රී ලංකාවේ ඇත. මෙම පිරිහීම වඩාත් බලවත් වයස 10-14 අතර ජන කාණ්ඩය තුලය.